ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA 1925

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 9 කාණ්ඩය 1 2012 ජුනි

# පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ තේ ක්ෂේත්‍රය තුළ වැඩිදියුණු කළ හැකිද?

ශ්‍රී ලංකා තේ කර්මාන්තය ඉතා දිගු ඉතිහාසයකට උරුමකම් කියන අතර, ශ්‍රී ලාංකීය තේ වල ගුණාත්මකභාවය නිසා එය ලෝක වෙළඳපොළෙහි ඉහළ මිලක් ලබාගැනීමට සමත් විය. නමුත් වර්තමානයේදී තේ ක්ෂේත්‍රය ගැටළු රාශියකට මුහුණ දී ඇත. අනෙකුත් තේ නිෂ්පාදන රටවල් හා සලකා බලන විට අප රටේ තේ කිලෝවක නිෂ්පාදන වියදම අනෙකුත් රටවලට වඩා ඉහළ අගයක් ගනී. ශීඝ්‍ර ලෙස ඉහළ යන කෘෂි රසායන ද්‍රව්‍යය, යන්ත්‍රෝපකරණ හා ඉන්ධන මිලත් වතු කම්කරු වේතනත් මේ සඳහා හේතු වේ. නිෂ්පාදන වියදම ශීඝ්‍ර ලෙස ඉහළ ගියද ලෝක වෙළඳපොළෙහි තේ මිල ගණන් ඉහළ යන්නේ ඉතා මන්දගාමීවය.

තවද කම්කරුවන්ගේ හා තේ ඉඩම්වල ඵලදායිතාව අඩු වීම තේ කර්මාන්තය මුහුණ දෙන තවත් ගැටළුවකි. තේ ක්ෂේත්‍රයේ කම්කරුවන් වෙනත් ක්ෂේත්‍ර කරා සංක්‍රමණය වීමද නොවැලැක්විය හැකි සාධකයකි. බිම් සැකසීමේ සිට අස්වනු නෙලීම දක්වා බොහොමයක් ක්‍රියාදාමයන් සඳහා කම්කරු ශ්‍රමය අවශ්‍ය වේ. පසුගිය වසර කිහිපය තුළ කම්කරු වේතන වරින් වර ඉහළ නැංවූවද කම්කරු හිගය තවමත් නොවිසුදුනු ගැටළුවකි. එම නිසා තේ වතු හිමියන්ට ලාභ ඉපයීම හෝ ක්ෂේත්‍රයේ දිගු කාලීන පැවැත්ම රඳවා ගැනීම ගැටළුවක් වී ඇත. එහෙයින් ඔවුන් අතිරේක ඉපැයීම් මාර්ග පිළිබඳව අවධානය යොමු කළ යුතු කාලය එළඹ ඇත. පරිසර හිතකාමී සංචාරක කලාප බවට තේ වගා පරිවර්තනය කිරීම, ආන්තික තේ ඉඩම් සඳහා වඩා සුදුසු වෙනත් කෘෂි භෝග හඳුන්වා දීම හා සත්ත්ව පාලනය ආරම්භ කිරීම ගත හැකි විකල්ප විසඳුම් මාර්ග ලෙස ගෙනහැර දැක්විය හැක. ඒ අතරින් පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාර ආරම්භ



කිරීමට ශ්‍රී ලංකාවේ තේ වතුවලට විභවයක් පවතීද යන්න පිළිබඳව ක්‍රමවත් අධ්‍යයනයක් මෙතෙක් සිදුකර නැති අතර, එය මෙම අංශයේ වර්ධනය හා ප්‍රචලිත වීම අඩුවීමට බලපා ඇත. ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ කෘෂි ආර්ථික විද්‍යා අංශය මගින් මෙම වසරේදී උඩරට තේ වතු (සමාගම් වතු) ආශ්‍රිතව අධ්‍යයනයක් සිදුකර, පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය සඳහා උඩරට තේ වතුවල විභවයක් ඇති බව සොයාගෙන ඇත. මෙම අධ්‍යයනයේදී උඩරට තේ වතු 13 ක් පමණ ආවරණය වන පරිදි එහි ඇති සම්පත්, මූලික පහසුකම්, වතු කළමණාකාරිත්වයේ පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය පිළිබඳ අවබෝධය ගැඹුරින් පිරික්සා බලන ලදී. ඊට අමතරව සංචාරකයන් ගැවසෙන ප්‍රධාන සංචාරක ස්ථාන කිහිපයක සංචාරකයින් 100 ක ගේ පමණ අදහස්, ඔවුන් පරිසර හිතකාමී සංචාරක කලාපයන් වෙනුවෙන් තක්සේරු කරන වටිනාකම ද විමසා බලන ලදී. මොවුන් තෝරාගැනීමේදී වයස, ස්ත්‍රී පුරුෂ භාවය, අදායම් මට්ටම, අධ්‍යාපන තත්ත්වය හා ජාතිකත්වය විහිදී යන පරිදි විවිධත්වයකින් යුතුව සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය මෑත කාලයේදී ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. 2011 මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව 2011 වසර තුළදී විදේශීය සංචාරකයින් 855,975 ක් පමණ මෙරටට පැමිණ ඇති අතර එය පෙර වසර හා සසඳන විට 4.4% ක වර්ධනයකි. එමගින් ඩොලර් මිලියන 575.9 ක ආදායමක් ශ්‍රී ලංකාවට ලැබී ඇති අතර එය පසුගිය වසරට සාපේක්ෂව 41.4% ක වර්ධනයකි.

පරිසර හිතකාමී සංචරනය පැහැදිලි කිරීමට විවිධ විද්වතුන් විවිධාකාර නිර්වචන භාවිතා කර ඇත."පරිසරය සහ අවට ජනතාවගේ තිරසාර පැවැත්ම සුරක්ෂිත කරමින් වගකීමෙන් යුතුව ස්වභාවික පරිසරයේ සංචාරය කිරීම"



පැහැදිලි හා සරල නිර්වචනයකි. ශ්‍රී ලංකාව ඉතා ඉහළ ජෛව විවිධත්වයකින් යුත් රටක් බැවින් පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීමේ ඉහළ විභවයක් රට තුළ පැවතුනද එය සුප්‍රසිද්ධ ස්ථාන කිහිපයක් සඳහා පමණක් සීමා වී ඇත. මෙම ස්ථානවලට අමතරව දැනට සංචාරකයින්ගේ නෙත නොගැටුණු, නමුත් ප්‍රයත්නයක් දරා සංචාරක කලාප බවට වැඩි දියුණු කල හැකි බොහෝ ස්ථාන ශ්‍රී ලංකාව තුළ පවතී. ඒ අතරින් තේ වතුවලට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. මනරම් දිය දහරාවන් හා මීදුම් පටවලින් සැඟවුනු අති සුන්දර පරිසරයක් හා සෞම්‍ය දේශගුණයක් තේ වතු ආශ්‍රිතව පැවතීම සංචාරකයින්ගේ නෙත් සිත් පැහැර ගැනීමට සමත් වේ. එමෙන්ම දැනට වතු ආශ්‍රිතව පවතින සම්පත් ඉතා සුළු ප්‍රාග්ධනයක් වැය කරමින් සංචාරක කර්මාන්තයට අවශ්‍ය ලෙස සකස්කර ගත හැකි වීම තේ වතු ආශ්‍රිතව පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය සඳහා අනෙකුත් ස්ථානයන් අතරින් ප්‍රමුඛස්ථානයක් ගැනීමට හේතු කාරණා වේ.

මෙය වටහාගත් සමහර වතු හිමියන් ඔවුන්ගේ තේ වතු පරිසර හිතකාමී සංචාරක කලාප ලෙස වැඩි දියුණු කිරීම දැනටමත් ආරම්භ කර ඇති අතර අවට පරිසරය නැරඹීම, කර්මාන්තශාලා නැරඹීම, ක්ෂේත්‍ර චාරිකා, කුරුල්ලන් නැරඹීම, බයිසිකල් පැදීම හා කඳු නැගීම වැනි ක්‍රියාකාරකම් සඳහා තේ වතු ආශ්‍රිතව නිරතවීමට සංචාරකයින්ට අවස්ථාව ලබා දී ඇත.

දැනට සුළු සංචාරකයින් පිරිසක් තේ වතු නැරඹීමට හුරුවී සිටියත්, සුවිශේෂිවූ මෙම අත්දැකීම් විඳගැනීමට කැමැත්තක් දක්වන දේශීය මෙන්ම විදේශීය සංචාරකයින් විශාල පිරිසක් සිටින බව පෙනී ගොස් ඇති බැවින් විශේෂයෙන් අක්කර 5 ක් හෝ ඊට වැඩි භූමි ප්‍රමාණයක් ඇති කුඩා තේ වතු හිමියන්ටද පවුලේ ශ්‍රමයද යොදාගනිමින් තම වතු, පරිසර හිතකාමී සංචාරක ස්ථාන ලෙස දියුණු කිරීමේ හැකියාවක් ඇත. එය ප්‍රධාන ආදායමට අමතරව ලැබෙන අතිරේක ආදායම් මාර්ගයකි. එම නිසා ඔවුන්ගේ ආර්ථික තත්තවය නංවාලීමට මෙය කදිම පිටුවහලක් වනු ඇත.

**ආචාර්ය එච්. ඩබ්. ශ්‍යාමලී, එන්. එල්. රාජවර්ධන**